රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 12/2005(X)

මගේ අංකය : EST-6/04/INS/1010-II
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2026.03.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

# <u>2026 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධරයන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 හා ඊට ආනුෂංගිකව නිකුත් කර ඇති චක්‍රලේඛ වෙත අවධානය යොමු කරවමි.

02. අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සෞඛ්‍ය ප්‍රතිලාභ ආවරණය පුළුල් කිරීමේ අරමුණෙන් රාජ්‍ය නිලධරයන් වෙත ලබා දෙන ප්‍රතිලාභ, ස්ථාවරව පවත්වා ගැනීම තහවුරු කිරීම පිණිස පහත පරිදි, දැනට පවතින විධිවිධාන සංශෝධනය කිරීමට හා නව විධිවිධාන ඇතුළත් කිරීමට 2026.02.09 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව, පහත පරිදි පවතින විධිවිධාන සංශෝධනය කිරීම හා නව විධිවිධාන ඇතුළත් කිරීම සිදු කරනු ලැබේ.

3.1 සංශෝධන.

| අනු අංකය | චක්‍රලේඛය | විධිවිධානය ඇතුළත් වගන්තිය | සිදු කරනු ලබන සංශෝධනය |
|---|---|---|---|
| 1. | 2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) | 03 | අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ සඳහා මාසික දායකත්ව මුදල, අවම මාසික දායකත්ව මුදල රු. 200/-, රිදී යෝජනා ක්‍රමය යටතේ මාසික දායකත්ව මුදල රු. 450/- සහ රන් යෝජනා ක්‍රමය යටතේ මාසික දායකත්ව මුදල රු. 750/- ලෙස සංශෝධනය කිරීම. |
| 2. | 2015.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(V) | ඇමුණුම I හි II වන කොටස | පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය යටතේ ලැබෙන ප්‍රතිලාභයන්හි II යටතේ සඳහන් උපරිම වයස් සීමාව "අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස" ලෙස සංශෝධනය කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| 3. | 2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) හි 4:4 උප වගන්තිය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2017.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VII) | 4:4 | ස්වභාවික මරණ සඳහා රක්ෂණ ප්‍රතිලාභ ලබා දෙන උපරිම වයස අවුරුදු 70ක් වන අතර අනෙකුත් රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ජීවිතාන්තය දක්වා ලැබිය හැකි ය. |

3.2 2016.04.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(VI) හි 06 වගන්තියට පසු පහත නව වගන්ති ඇතුළත් කරනු ලැබේ.

| අනු අංකය | නව වගන්තිය | විධිවිධානය |
|---|---|---|
| 1. | 07 | සියලුම රාජ්‍ය නිලධරයන්ගේ අග්‍රහාර හිමිකම් ගෙවීම් 2026.04.01 දින සිට අග්‍රහාර දත්ත පද්ධතියේ ලියාපදිංචි තොරතුරු පදනම් කර ගනිමින් සිදු කරන බැවින්, අග්‍රහාර දත්ත පද්ධතියේ ලියාපදිංචි වීම අනිවාර්යය වන අතර නිලධරයන්ට අදාළ තොරතුරු සංශෝධනය වන අවස්ථාවල දී අදාළ ආයතන මඟින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම ද අනිවාර්යය වේ (මේ සම්බන්ධයෙන් උපදෙස් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නිකුත් කරනු ඇත). |
| 2. | 08 | අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණාවරණය සඳහා සෞඛ්‍ය රක්ෂණ/ පුද්ගල හදිසි අනතුරු රක්ෂණ සම්බන්ධයෙන් වන සම්මත බැහැර කිරීම් අදාළ කර ගනු ලැබේ (මෙම බැහැර කිරීම් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් තීරණය කරනු ඇත). |
| 3. | 09 | ස්වාමිපුරුෂයා හා භාර්යාව යන දෙදෙනාම රාජ්‍ය නිලධරයන් වන අවස්ථාවක, ප්‍රතිලාභ ලබා ගන්නා නිලධරයා විසින්ම අග්‍රහාර හිමිකම් අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තව ද,<br><br>I. එක් දරුවෙකු වෙනුවෙන් එක් අවස්ථාවක දී අදාළ එක් ප්‍රතිලාභ වර්ගයක් සඳහා අග්‍රහාර හිමිකම් අයදුම් කළ හැක්කේ මව/ පියා යන දෙදෙනාගෙන් එක් අයෙකුට පමණි.<br><br>II. රක්ෂණලාභියා හා කලත්‍රයා යන දෙදෙනාම රජයේ නිලධරයන් වන එහෙත් අසමාන රක්ෂණ ක්‍රමවලට දායක වී ඇති අවස්ථාවක රක්ෂණලාභියාට පමණක් හිමිවන ප්‍රතිලාභ හැර අනෙක් පොදු ප්‍රතිලාභ (කලත්‍රයාට හා යැපෙන්නන්ට ලැබෙන) වැඩි ප්‍රතිලාභ හිමිවන රක්ෂණ ලාභියා මඟින් අයදුම් කිරීමට අවස්ථාව ලබා දීම. |

| | | |
|---|---|---|
| 4. | 10 | රෝහල්ගතව සිටිය දී අග්‍රහාර සාමාජිකයා මිය ගියහොත් අදාළ නිලධරයාගේ මරණයට පෙර වෛද්‍ය හිමිකම්,<br>I. නිලධරයා විවාහක නම්, කලත්‍රයාට හෝ එක් දරුවෙකුට (අනෙක් පාර්ශවයේ කැමැත්ත මත) ලබා ගත හැකි ය.<br>II. නිලධරයා අවිවාහක නම්, දෙමාපියන්ගෙන් මව හෝ පියා හෝ යන දෙදෙනාගෙන් එක් අයෙකුට (අනෙක් පාර්ශවයේ කැමැත්ත මත) ලබා ගත හැකි ය. |
| 5. | 11 | අදාළ බිල්පත්වල දින සිට/ නිලධරයා රෝහලෙන් බැහැර වූ දින සිට දින 90 ක් තුළ අදාළ බිල්පත් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලැබී තිබිය යුතු ය.<br>I. ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ඉල්ලුම් පත්‍ර දින 90 ක් තුළ ලියාපදිංචි කර ඇත්නම් එම අයදුම්පත්‍ර සලකා බැලීමට කටයුතු කරනු ලබයි.<br>II. සාමාන්‍ය තැපෑලෙන් හා අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් එම අයදුම්පත්‍ර දින 90 ක් ඇතුළත ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලැබී තිබිය යුතු ය.<br>III. අග්‍රහාර සාමාජිකයා මිය ගොස් ඇති විට, ඉල්ලුම්කරුවන් විසින් සාමාජිකයා මිය ගිය දින සිට මාස 06 ක් ඇතුළත මරණ හිමිකම් ලිපිගොනුව ආයතන ප්‍රධානියා හරහා ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කළ යුතු ය. |
| 6. | 12 | අග්‍රහාර සාමාජිකයා විසින් නියමිත කාලය තුළ තම ආයතන ප්‍රධානියා වෙත භාර දෙනු ලබන අයදුම්පත්‍ර නියමිත දිනට පෙර ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කිරීම ආයතන ප්‍රධානියා සතු වගකීමක් වන අතර ඊට සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගැනීමට ආයතන ප්‍රධානියා විසින් වග බලා ගත යුතු ය. |

04. ඉහත 3.1 වගුවෙහි ඇතුළත් සංශෝධිත විධිවිධාන සහ 3.2 වගුවෙහි ඇතුළත් නව විධිවිධාන සමඟ 2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 හා ඊට ආනුෂංගිකව නිකුත් කර ඇති චක්‍රලේඛවල සඳහන් අනෙකුත් සියලුම විධිවිධාන නොවෙනස්ව බලපැවැත්වේ.

05. මෙම චක්‍රලේඛ විධිවිධාන 2026.03.01 දින සිට ක්‍රියාත්මක වේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-6-est@pubad.gov.lk